මහ/ ශ්‍රී රාහුල විද්‍යාලය - කටුගස්තොට

පළමු වාර පරීක්ෂණය - 2020

සිංහල භාෂාව හා සාහිත්‍යය | II කොටස | 11 ශ්‍රේණිය

නම :.................................................................... වි.අංකය:............................ කාලය පැ.2 යි.

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. ප්‍රශ්න අංක i සිට x දක්වා කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා එය ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. සිංහල හෝඩියේ ඇතුළත් අක්ෂර එක බැගින් ලියා දක්වන්න.
(අ) කණ්ඨ ඕෂ්ඨජ (ආ) ඌෂ්මාක්ෂර

ii. පහත වාක්‍යයෙහි ඇතුළත් සදොස් වචන දෙක නිදොස් කර ලියන්න.
යතාර්ථවාදී චිත්‍රපට සම්භාවනීය ප්‍රේක්ශකයෝයෝ අගය කරති.

iii. පහත සඳහන් වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.
(අ) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විවිධ ලෙඩ රෝග පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කළහ.
(ආ) වෛද්‍යවරයෙක් සාත්තු සේවිකාවක කැඳවයි.

iv. පහත පදවලට විරුද්ධ පද ලියන්න.
(අ) අනුමාන (ආ) පරායත්ත

v. පහත සඳහන් පද සන්ධි කොට සන්ධි වර්ගය ලියන්න.
(අ) ඔවුන් + ඔවුන් (ආ) දව + කල්

vi. පහත සඳහන් වාක්‍ය නිදොස් කර ලියන්න.
(අ) ඕ තොමෝ මවට වැන්දහ (ආ) මවුවරුන් තුමු දරුවෝ රකිති

vii. පහත රූඪිවල අරුත් දක්වන්න.
(අ) ගෙදරටම නාකි වෙනවා (ආ) දහම් ගැටයක්

viii. පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් යුත් පද කවර ව්‍යාකරණ වර්ගයට අයත්දැයි දක්වන්න.
(අ) සිහිල් සුළං රැළි සේද රෙද්දක් **සේ** මගේ ගතෙහි දැවටෙයි
(ආ) දරුවන් වැඩිහිටියන්ගේ **අනුදැනුමෙන්** යුතුව කටයුතු කළ යුතුය.

ix. (අ) අනන්ත ............................ (ආ) ................................... ගාම්භීර
යන යුගල පද සම්පූර්ණ කරන්න.

x. පහත (අ) (ආ) යෙදුම්වල ප්‍රථම වචනය සමග දෙවන වචනය නොගැලපීමක් ඇත. වඩාත් ගැලපෙන ලෙස ප්‍රථම වචනය හෝ දෙවන වචනය වෙනස් කර ලියන්න.
(අ) සාර බිම (ආ) පළමු ත්‍යාගය



Created by Universal Document Converter

02. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරින් එකක් තොරගෙන වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න. ඒ සඳහා සුදුසු මාතෘකාවක්ද යොදන්න.

(අ) අපේ රටේ නාට්‍ය කලාව අද උසස්ම තත්වයකට පත්ව ඇත. වාර්ෂිකව පැවැත්වෙන රාජ්‍ය නාට්‍ය උත්සවය නාට්‍ය කලාව නගා සිටුවීමට මෙන්ම නළු නිළි දක්ෂතා වර්ධනයටත් ප්‍රේක්ෂකයන්ගේ වින්දන ශක්තිය දියුණු කිරීමටත් මහත් අනුබලයකි. වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍ය ආදි වශයෙන් වර්ග කොට දැක්විය හැකි නාට්‍ය කලාවේ අරමුණ විය යුත්තේ විනෝදය සැපයීමට වඩා ජනතාව තුල උසස් වින්දන ශක්තියක් ඇති කිරීමයි.

(ආ) ශ්‍රී ලංකාව තුළ මගී ප්‍රවාහනය ප්‍රශස්ත මට්ටමක නොපවතී. පෞද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකම මේ සඳහා දායක වේ. මෙහිලා වැඩි සහභාගිත්වයක් ඇති පෞද්ගලික අංශ කෙරෙහි මහජන ප්‍රසාදයක් නොපවතී. රටේ මගී ප්‍රවාහන සේවය විධිමත් කිරීමට ඵලදායක පියවර ගත යුතුව ඇත.

(ඉ) ළමයින් ජාතියේ ජීවනාලියයි. ඔවුන්ගේ සුරක්ෂිතභාවය සුරකින ළමා අයිතිවාසිකම් ද නීතිගත කොට තිබේ. එහෙත් විවිධ අපචාර, පීඩා ළමා පරපුර හමුවේ එල්ල වී ඇත. ළමා පරපුරේ හෙට දවස වෙනුවෙන් වැඩිහිටියන්ගේ අවධානය යොමු විය යුතුය.

(ඊ) සෞඛ්‍ය සම්පන්න ජනතාවකගේ පැවැත්ම උදෙසා ක්‍රීඩාවලින් සැලසෙන සේවය අති විශාලය. ජයෙහි දී මෙන්ම පරාජයෙහි දී ද නොසැලී සිටීමටත් විනෝදයේන කාලය ගෙවීමටත් ක්‍රීඩා මගින් ලැබෙන පරිචය අගය කළ යුතුය. විවිධ ක්‍රීඩා ඉසව් ඔස්සේ ඉදිරියට යන අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලබන ජයග්‍රණ හා සම්මාන කරණකොට ගෙන අපේ රටට ලැබෙන ගෞරවය, කීර්තිය හා ප්‍රචාරය කාගේත් සතුටට කාරණයකි. ජනතාව ඒකරාශී කරන ක්‍රීඩා ක්ෂේත්‍රය කෙරේ අවධානය යෙදීම ජාතික අවශ්‍යතාවයකි.

03. පහත සඳහන් ජේදය වචන 50 - 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශ අග ලියන්න.

භාෂාවේ උපත කවදා කෙසේ සිදු වුණි දැයි අපට ඉඳුරා කිව නොහැකි ය. එසේ වුව ද භාෂාව කෙරෙහි මිනිසාගේ අවධානය මුලින් ම යොමු වන්නට වූයේ ඈත අතීතයේ සිටම බව නම් නිසැක ය. මෙම උද්යෝගය පෙරදිග රටවලට පමණක් සීමා වුවක් නොවුණි. පුරාතන භාරතීය පඬිවරයන් මෙන් ම පැරණි හීබ්රෑ ලේඛකයෝත් ග්‍රීක දාර්ශනිකයෝත් භාෂාව අරබයා නොයෙක් මතවාද කලින් කල ඉදිරිපත් කළහ. අද ද නොයෙක් දෙනා නොයෙක් ලෙසින් භාෂාව ගැන සොයා බලති. භාෂාව ගැන සොයා බලන ව්‍යාර්ථිහු පළල් විෂයයන් දෙකොටසකට අයත් වෙති. ඉන් එක් කොටසක් ස්වකීය කෙෂ්ත්‍රයට අදාළ උපාංගයක් හැටියට ගෙන විමර්ශනයෙහි යෙදෙති. සාහිත්‍යකරුවා, දාර්ශනිකයා, මානව විද්‍යාඥයා, මනෝ විද්‍යාඥයා සහ සමාජ විද්‍යාඥයෝ මෙයින් පළමු වන කොටසට අයත් වෙති. භාෂා ගුරුවරයාත් වාග් විද්‍යාඥයාත් මෙයින් දෙවැනි කොටසට අයත් වෙති. සාහිත්‍යකරුවාගේ අරමුණ භාෂාව විමර්ශනය නොව රස නිෂ්පාදනයයි. දාර්ශනිකයාගේ අභිප්‍රාය විශ්වයේ හා මිනිසාගේ පැවැත්ම පිළිබඳ යථාර්ථය සොයා බැලීමයි.

04. පහත සඳහන් ජේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

කිසියම් සාහිත්‍ය කෘතියක් සාර්ථක වීමට නම් එහි රසය හා උපයෝගීතාව යන අංශ දෙක කෘතිය තුළ වෙන් වෙන්ව තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒවා සුසංයෝගීව තිබිය යුතු ය. සාහිත්‍ය රසය යනු අප විඳීමට පුරුදු නිශ්චිත රස ගණනාවකින් එකක් නොව උත්තරීතර රසය කි. මක් නිසා ද යත් එම '' උත්තරීතර රසය'' ලැබෙනුයේ විහිෂ්ට කාර්යයක් වන නිරාමිස චිත්ත සමාධිය මඟින් බැවිනි. එ මෙන් ම සාහිත්‍ය කෘතියක උපයෝගීතාව, නම් එහි උපදේශනාත්මක ගාම්භීර්යය, රසාත්මක වූ ගාම්භීර්යයක් විය යුතු ය. එය කෙනෙකු විසින් ඉටු කළ යුතු යයි සම්මත යුතුකම් හා වගකීම් පිළිබඳව ඉගැන්වීමට අදාළ ගාම්භීර්යයක් නොව සෞන්දර්යමය වූ ගාම්භීර්යයක් විය යුතු ය. දුෂ්කර බන්ධනවලට ඇබ්බැහි වූවන්ට



Created by Universal Document Converter

සාහිත්‍යය කෘතියක ඇති සෞන්දර්යාස්වාදය පිළිබඳව නොසලකා තම රුචිය හරස් පද ප්‍රහෙලිකා විසඳීමේ තත්ත්වයෙන් පවත්වා ගත හැකි ය. එසේ ම අධ්‍යාපනඥයෙකුට සාහිත්‍ය කෘතියක ඇති අගය එහි ඇති උපදෙස් හෝ ඓතිහාසික තොරතුරුවලට හෝ සීමා කළ හැක.

(i) මෙහි සඳහන් පරිදි සාහිත්‍ය කෘතියක පැවැතිය යුතු ප්‍රධාන අංග කවරේ ද ?
(ii) සාහිත්‍ය කෘතියක උපදෙස් අඩංගු නොවිය යුතු යැයි මෙම පාඨයෙන් හැඟේ ද ?
(iii) මේ ඡේදයට අනුව සාහිත්‍ය රසය ''උත්තරීතර'' වනුයේ කවර හෙයින් ද ?
(iv) නිරාමිස චිත්ත සමාධිය යන්න පැහැදිලි කරන්න.
(v) දුෂ්කර බන්ධන සොයන්නන්ගේ සහ අධ්‍යාපනඥයන්ගේ කාර්යයන් සාහිත්‍ය රසාස්වාදයෙන් පරිබාහිර බවක් මෙයින් හැඟවේ ද ?

05. පොළොන්නරුව ජයන්තිපුර ජනතාව කාලයක් තිස්සේ පානීය ජල ප්‍රශ්නයෙන් පීඩා විඳිති. කැළණිය, හුණුපිටිය පාර වේවැල්දුව නිවාස සංකීර්ණයේ වෙසෙන සමීර ගුණවර්ධන මහතාගේ ධන පරිත්‍යාගයෙන් ආරම්භ කළ ජල ව්‍යාපෘතිය දැනට මේ ප්‍රදේශයට ඉමහත් සෙතක් වී ඇත. ප්‍රදේශයේ යහ සාධක සමිතියේ ඒකමතික යෝජනාවකට අනුව මේ ව්‍යාපෘතියට මූලිකත්වය ගත් එම සත්ගුණවත් නිර්මාතෘවරයාට කෘතඥතාව දැක්වීමේ ලිපියක් වහා යැවිය යුතු බවට තීරණය වී ඇත. එම සමිතියේ ගරු ලේකම් දුමින්ද බණ්ඩාර ඔබ යැයි සිතා වචන 100 කින් පමණ එම ලියුම ලියන්න.

<u>නැතහොත්</u>

පහත සඳහන් විස්තරය පදනම් කොට ගෙන අත් පත්‍රිකාවක් සකස් කරන්න. (වචන 100 ප්‍රමාණවත්ය)

කොළඹ - 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතේ, ශ්‍රී ජිනරතන කාර්මික විද්‍යාලයේ ලේඛකාධිකාරීවන ඔබ රජයේ පිළිගත් දෙමළ භාෂා පාඨමාලාවක් ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලැබේ. දෙමළ භාෂාව මුල සිටම ඉගෙන ගැනීමට කැමැති සියලු දෙනාට ම මේ සඳහා අයදුම්කළ හැකිය. විශ්ව විද්‍යාල හා ගුරු විද්‍යාල කථිකාචාර්යවරුන් විසින් ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලැබේ. සෑම සෙනසුරාදාවකම ප.ව. 1.00 සිට ප.ව. 4.00 දක්වා පන්ති පැවැත්වේ. සිසුන් බඳවා ගැනීම 2019 අප්‍රේල් 07 දක්වාය.



Created by Universal Document Converter

මහ/ ශ්‍රී රාහුල විද්‍යාලය - කටුගස්තොට

පළමු වාර පරීක්ෂණය - 2020

සිංහල | III කොටස | 11 ශ්‍රේණිය

කාලය පැ. 2යි

❖ 1, 2, 3, 4 යන ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්න වලින් එකකටත් පමණක් පිළිතුරු සපයන්න.

❖ මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.

01. (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස් වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. ඒ වී මා ඇල්ලු සේ ඉතා නපුරු'යි මම ලැජ්ජාවට පැමිණියෙමි.

(අ) මෙය කාගේ ප්‍රකාශයක්ද ?

(ආ) මෙම ගද්‍ය ඛණ්ඩය ඇතුළත් මුල් පොත රචනා වූයේ කවර යුගයකද ?

ii. ශිල්පයට උපචාර නොකරන්නා එල නොදෙයි පුතා''

(අ) පුතා යනුවෙන් ආමන්ත්‍රණය ලැබුවේ කවරෙක්ද ?

(ආ) ගුරුවරයා යෝජනා කළ උපචාරය කුමක්ද ?

iii. පටන් සුරිඳු දුන් උපදෙස් සිහි කොට

ඉටන් බෙළෙන් දැමුවෙන් ගුලි අහසට

(අ) මෙහි ඉතිරි කවි දෙපදය ලියන්න.

(ආ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

iv. එසේය අනික් කාට කියම්ද ? තොපිම කොට ඇවිදිනා කටයුතු හෙයින් තොප ම අරහයා කියමි

(අ) මෙසේ කියන්නේ කවුරුද ?

(ආ) මෙම කතා වස්තුවේ කතුවරයා කවුද ?

v. ඔව් ඕකට ගිය කෙනෙක් ආයේ එන්නේ නෑ

(අ) මෙහි කියන්නේ කිනම් ස්ථානයක් සම්බන්ධයෙන්ද ?

(ආ) මීට අදාළ කෘතිය නම් කරන්න.

vi. (අ) ''සිංහල ගැමි නාටකය'' ''සාහිත්‍ය විද්‍යාව'' කෘති රචනා කළ ලේඛකයා කවුද ?

(ආ) සංවාදය, එකෝමත් එක රටක යන පද්‍ය සංග්‍රහ රචනා කළ ලේඛකයා කවුද ?

vii. (අ) හංස සංදේශ කතුවරයා විසින් රචිත වෙනත් කෘති 2 ක් ලියන්න.

(ආ) හංස සංදේශයේ කවර වැනුමක් නිර්දිෂ්ට කොටසට අයත් වේද ?

viii. කාටත් හිමි පොදු දේ නම්

නැති බැරි හිඟ අවහිර කම්

(අ) ඉහත පද්‍ය ඛණ්ඩය ඇතුළත් නිර්දිෂ්ටයේ කතුවරයා කවරෙක්ද ?

(ආ) මෙම කාව්‍ය පන්තියේ තේමාව පිළිබඳ ඇති සුවිශේෂතාව කුමක්ද ?

(ල. 2 x 10 = 20)



Created by Universal Document Converter

ix. සැඟවෙමි එබෙමි නිසසලවෙමි සසලවෙමි
ඇඹරෙමි එහෙත් පසු නොබසිමි නොනවතිමි
(අ) මෙම කවි දෙපදයේ දැක්වෙන කාව්‍යාලංකාරය කුමක්ද ?
(ආ) මෙම කවි පන්තිය රචනා කළ කවියාගේ සම්පූර්ණ නම කුමක්ද 2

x. (අ) සීගිරි කුරුටු ගී කවර සියවසකට අයත් වේද ?
(ආ) පැරණිම සිංහල කෘතිය වන දම්පියා අටුවා ගැට පදයේ රචකයා කවුද ?

02. පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

i. පුත තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නොවේ.
(අ) මේ පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.
(ආ) තෙල ලෙස කිරීම යනු කුමක්ද ?

ii. හෙණයක් සේ පතිත වූ අහසින්
හිස මතට දෙදරුම් දී
<u>බමවාම</u> ඉඳුරන් අඳුරු කරමින්
පහරිනා රුදුරු
කිමිද නොකියා යන්ට කාරණා
වීද <u>මනදොළ</u> කිසිත් නොපිරුණා

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) සිංහයාගේ හිසට හෙණයක් සේ පාත් වුයේ කුමක්ද ?

iii. ''යටත්නි මපුතු මා කෙරෙහි නොබිඳ පියටියාව''
(අ) මා පුතු මා කෙරෙහි නොබිඳ යැයි ආචාර්යා ප්‍රකාශ කළේ කිනම් හේතුවක් නිසාද ?
(ආ) යටත්ති ලෙස ප්‍රකාශ කළේ කාටද ?

iv. වරවෙණ නද අසමින් සිත සතොසිනි
<u>සරහැර</u> සියෙතුන් පියපත් විදිමිනි
පුරඹර වයමින් සිටි රඟ කුම් වැනි
සුර සෙනඟට <u>සුරන්</u> පැනවු වැනි
(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න
(ආ) පක්ෂීන් සිටි ආකාරය ඉහත කවියා දක්වා ඇත්තේ කෙසේද ?

v. නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ
ඒ බව සිහි කොට මෙලො වේ
යුතුකම ඉටුකළ යුතු වේ

(අ) මෙහි ප්‍රදර්ශනය කෙරෙන කාව්‍යාලංකාරය කුමක්ද ?
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදයෙන් අනාවරණය වන්නේ කුමක්ද ?

(ල. 4 x 5 = 20)



Created by Universal Document Converter

03. බැද්දේගම දපයක්කාරයකු වූ සිලිදුගේ දියණිය වන පුංචි මැණිකා

i. අසරණය

ii. අහිංසකය

ඉහත චරිත ලක්ෂණ උදෙසා නිර්දිෂ්ට කොටසින් සුදුසු නිදසුන් අවස්ථා දෙක බැගින් හැරපා එකී අදහස් පිළිබඳව විග්‍රහයක යෙදෙන්න.

නැතහොත්

ජන කවියා i. කාව්‍යාලංකාර හා

ii. අත්දැකීම්

ඇසුරෙන් තම නිර්මාණ සරසාගෙන ඇති ආකාරය ''හානා හිය පානා අඬ හැරෙන් දැනේ'' යන පද්‍ය පන්තියෙන් නිදසුන් දෙක බැගින් උපුටාගෙන විස්තර කරන්න.

04. i. චිත්තාකර්ෂණීය පරිසරයෙන් ආඪ්‍ය හා

ii. සෞභාග්‍යයෙන් ආඪ්‍ය

ඉපැරණි ගමන තොරතු කෑරගලය වැජඹෙයි මේලෙසින් සිට කවි පන්තියෙන් ඉදිරිපත් කරන අයුරු එකිනෙකට නිදසුන් දෙක බැගින් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

නැතහොත්

සද්ධර්මරත්නාවලිය විශිෂ්ට ග්‍රන්ථයක් ලෙස සැලකීමට එහි එන චරිතවල දක්නට ලැබෙන සජීවී බව බොහෝ දුරට හේතුවන ආකාරය.

i. උග්ගසේන සිටු පුත්ගේ චරිතය

ii. විද්දත් පියාගේ චරිතය

ඇසුරෙන් නිදසුන් දෙක බැගින් ගෙනහැර පා විමසීමට භාජනය කරන්න.

❖ **5, 6, 7 ප්‍රශ්න වලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.**

05. රසවත් කාව්‍ය සංකල්පනා ඔස්සේ බාලපරපුර වෙත දේශානුරාගී ආකල්ප ප්‍රවර්ධනය සඳහා ගන්නා වෑයම එස්. මහින්ද හිමිගේ නිර්දිෂ්ටයෙන් උපුටා ගන්නා නිදසුන් තුනක්වත් මගින් සහේතුකව පෙන්වා දෙන්න.

06. තම උරුමය කරා නොබියව හා ධෛර්යවන්තව ගමන් කිරීමට අදිටන් කරගත් යෞවනත්වයෙන් හෙබි චරිතයක් ලෙස සිංහබාහු චරිතය හැඳින්වීමට යෝග්‍ය නිදසුන් තුනක්වත් නියමිත කොටසින් උපුටාගෙන පැහැදිලි කරන්න.

07. අහිංසකයින් මිනීමරුවන් බවට පත්වන්නේ කවර හේතූන් නිසාදැයි අගුල්මල් දමනය ඇසුරෙන් ගැළපෙන නිදසුන් අවස්ථා තුනක් ඇසුරෙන් විමසන්න.



Created by Universal Document Converter